# මිනිස් වෙදකමට අලි පිහිට

**වෛද්‍ය පුෂ්පා කුලනාථ[1]  වෛද්‍ය පී.ඩී.සේනාරත්න[2]  වෛද්‍ය ඩබ්.ඒ.සේනානායක**

ලංකාව තුළ පවතින සම්ප්‍රදායන් අතරින් දේශීය වෛද්‍යවරුඅතර පවතින වෙදකම මූලධර්මානුකූලව සමාන කමක් පෙනුනද භාවිත වන ඖෂධ ඇසුරින් බෙහෙවින් වෙනස්කම් පවතී. පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමයන් මේ වන විට අභාවයට පත්ව ඇතත් භාවිත වන අතලොස්සද සැලකිය යුතු වෛද්‍ය සේවාවක නිරතව සිටින බව මාධ්‍යයන් ඔස්සේ ලැබෙන වාර්තා වලින් පෙනේ. එමෙන්ම රෝගී ප්‍රතිකාරය සඳහා භාවිත වන අමුද්‍රව්‍ය අතරට එකතුවන ඖෂධ, සාම්ප්‍රදායික ආයුරුවේද වෛද්‍ය ක්‍රමයේ භාවිත නොවන්නේය. ශාක වල පංචාංගයන්ට (ගෙඩි, කොළ, මුල්, පත්‍ර, පොතු) අමතරව පාෂාණ වර්ග සහ සත්ව කොටස් ද මිනිස් සිරුරේ බාහිර අභ්‍යන්තර වශයෙන් හටගන්නා රෝග සඳහා ප්‍රයෝජනයට ගනුලැබේ. ඒ අතරින් සාම්ප්‍රදායික කෙම් ක්‍රම ද රෝගීන් ගේ සුවය සඳහා භාවිත වේ. අලි වෙදකම මනුෂ්‍යයන් අතින් සිදුවන අතර අලියාගේ ශරීර කොටස් මනුෂ්‍ය රෝග සුවයට භාවිත කරනු ලැබීම පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ තේමාව වේ. තොරතුරු සොයා යාම අද භාවිතයේ යෙදන වට්ටෝරු පුස්කොළ පොත් හා ජනප්‍රවාද ඇසුරින් සිදු කෙරින. භාවිතාව අනුව දැනගන්නට ඇත්තේ ප්‍රයෝජ්‍ය කොටස් ලබා ගන්නා ඇත් කුළය ශ්‍රේෂ්ඨතම වර්ගයක් බව මූලිකව සොයා බැලිය යුතු බවයි. ඇතාගේ ශරීර අංග ඖෂධ වශයෙන් ප්‍රයෝග කිරීම අභ්‍යන්තර හා බාහිර දෙයාකාරයටම සිදුකරනු ලැබේ. එමෙන්ම සෙසු ශාක ඖෂධ හා පාෂාණ එමෙන්ම තෙල් සූධා වර්ග සමඟ මිශ්‍ර කර සංයෝග වශයෙන් භාවිත වේ. අලි ඇතුන් ගේශරීර කොටස් ඇතුළත් ඖෂධ සංයෝග තෙල් වර්ග අභ්‍යන්තර වශයෙන්ද, පත්තු වර්ග (බාහර ආලේප) සහ තෙල් බාහිර හා නිසි සේ සංයෝග කර දෙනු ලැබේ. රෝග වර්ග වශයෙන් කැඩුම් බිඳුම්, බාහිර වන, ජංගම විෂ ශරීර ගතවීම්, බාහිර වන පිළිකා, මුඛයේ හට ගන්නා ගෙඩි වර්ග යනාදී රෝග සඳහා මෙම කොටස් භාවිතවේ. ග්‍රහ අපල සඳහා යන්ත්‍ර මන්ත්‍ර සහ හදි හූනියම් සඳහා ප්‍රයෝජ්‍ය අංගයක් වන වල්ගයේ කෙඳි භාවිත වීම පිළිබඳව තොරතුරු ඇත. කෙම් වයෙන් පුරුෂ ශක්තිය වර්ධනය කිරීම සඳහා වල්ගයේ කෙඳි යොදාගනු ලබන අතර ඊට ඉතා මේරූ කෙඳි යොදාගනු ලැබේ. හඳුනාගත් රෝග කිහිපයකට සාර්ථක දේශීය ඖෂධ ප්‍රයෝගයන් වශයෙන් හඳුනාගෙන ඇති අලියාගේ ශරීර කොටස් භාවිත කර සිදුකරනු ලබන වෙදකම අතුරුදන් වෙමින් පවතින්නේ කලියුගයේ අභියෝගයද නැතහොත් තන්හාධික මූඪයන්ගේ අදූරදර්ශීකමද යන්න හඳුනා අලි ජීවිත සුරක්ෂිත කිරීමටත් ඖෂධ තිරසර භාවිතාවටත් පවතින ක්‍රමවේද ප්‍රමාණවත් නොවේ නම් ක්‍රියාවෙහි යෙදෙන නීති පද්ධතියක් ඇතුළත් නව ක්‍රම පිළිවෙතක් සැකසීම ප්‍රමාද නොකළ යුතු බවයි.

**මුඛ්‍ය පද :- සම්ප්‍රදායික වෙදකම, ඖෂධ, ආලේප, තෙල්, සංයෝග**

***වෛද්‍ය පුෂ්පා කුලනාථ BAMS (Hon)  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ විශ්ව විද්‍යාලය රාජගිරිය. * වෛද්‍ය පී.ඩී.සේනාරත්න BAMS (Hon)  *වෛද්‍ය ඩබ්.ඒ.සේනානායක BAMS (Hon)**